# ඉන්දීය මාඕවාදීහු බටහිර බෙංගාලයේ පිහිටි පොලිස් කඳවුරු අත්පත් කර ගනී.

මෙම ලිපිය BBC ප්‍රවෘත්ති සේවයෙන් 2010 පෙබරවාරි 16 දින ප්‍රකාශයට පත් විය.

බටහිර බෙංගාලයේදී මාඕ කැරලිකරුවෝ හමුදා හමුදාභටයින් 24 දෙනෙකු මරා දමති. ඉන්දියාවේ බටහිර බෙංගාල ප්‍රාන්තයේ නිළ නිවේදනයකට අනුව, සන්නද්ධ මාඕවාදීහු පැරාමිලිටරි හමුදා කඳවුරට ප්‍රහාරයක් එල්ල කර, අඩුතරමින් හමුදා භටයින් 24 ක් මරා දමන ලදි. සඳුදින සිල්ඩා ග්‍රාමයේ පිහිටි ERF (Eastern Frontier Rifles) කඳවුර වටකර යතුරුපැදිවලින් පැමිණි 50 ක තරම් කැරලිකරුවෝ ඊට වෙඩි තැබීමට පටන් ගත්හ. ස්වයංක්‍රීය අවි රැගත් පාබල කැරලිකරුවන්ද ඊට සහභාගි වී ඇත.

ඉන්දීය ප්‍රාන්ත වල කොමියුනිස්ට් පාලනයෙන් ඇති කිරීම උදෙසා 20 වසරක් තිස්සේ කරගෙන ගිය අරගල වලින් 6000 ට වැඩි පිරිසක් මරුමුවට පත් ව ඇත. ඉන්දීය රජය විවිධ ප්‍රාන්ත වල වෙසෙන කැරලිකරුවන්ට එරෙහිව දැනට දැවැන්ත ආක්‍රමණශීලී ප්‍රහාරයක් එල්ල කිරීමට පටන් ගෙන ඇත. ''ඉන්දියාවට ඇති ප්‍රබල අභ්‍යන්තර ආරක්ෂක අභියෝගය'' ලෙස අගමැති මන්මෝහන් සිං මහතා ප්‍රකාශ කරතිබුණේ මාඕවාදී කැරලිකරුවන්ය. ඉතිරි දිස්ත්‍රික්ක 600 න් 223 කම දැන් කැරලි පවතී.

## බිම් බෝමබ (Land Mines)

බටහිර මඩිනාපූර් දිස්ත්‍රික්කයේ මහේස්ත්‍රාත්වරයා වන N.S. නිගැම් BBC යට කියා සිටියේ භට කණ්ඩායම් දියත් කළ කෙටි මූලික ප්‍රහාරයන්ට පසුව මාඕවාදීන් විසින් කඳවුර බලයෙන් අත්පත්කර ගත් බවයි. ''ඊළඟට මාඕවාදීහු කඳවුර ගිනිබත් කර, කඳවුරට වැටී ඇති සම්පූර්ණ පාර පුරාම බිම් බොම්බ අතුරා ඇත.'' ''අඳුර විනිවිදින කණ්නාඩි සහ බිම්බෝම්බනාශක වාහන වලින් සමන්විත හමුදා මධ්‍යම රාත්‍රියේදී කඳවුරට ළඟා විය'' යන්න නිගැම් මහතා පැවසීය. පසුව කඳවුර තුළින් හා අවටින් මළසිරුරු 24 ක් සොයාගෙන ඇත. එමෙන්ම එවායින් සමහරක් දරුණු ලෙස දැවී අඟුරු බවට පත්ව ඇතැයි, ඔහු කියා සිටියේය.

බරපතල ලෙස තුවාලෙ ලද භට පිරිස් ප්‍රතිකාර සඳහා ප්‍රාන්ත අගනුවර වන කල්කටාවට ගෙනයන ලදි. නිළධාරීන් පවසන්නේ අඩුම තරමින් තවත් සොල්දාදුවන් 12 ක් පමණ අතුරුදන්ව ඇති බවයි.

එදින රාත්‍රී සිලිඩා වලට ළඟා වූ පොලිස් නිළධාරියෝ කියා සිටියේ වෙඩි ප්‍රහාරවලින් බේරී පලා යාමට තැත් කළ පැරාමිලිටරි භට කණ්ඩායමට කැරලිකරුවන් විසින් වෙඩිතබා මරා දමා ඇති බවයි. මෙම ප්‍රහාරය සිදුවන විට ERF භටයින් අඩුම තරමින් 50 ක් වත් එදින කඳවුරේ සිට ඇති බව බටහිර බෙංගාලයේ පොලිස් ප්‍රධානයා වන බුහුපින්ඩර් සිං පවසනවා.

කඳවුරේ අවි ගබඩාවෙන් විශාල අවි තොගයක් පැහැරගෙන පසුව මාඕවාදීන් සිල්ඩාවෙන් ඉවත්ව ගොස් තිබෙනවා.

කැරලි හමුදා අංශයේ නායක කොටෙස්වරා රාඕ නොහොත් කිසෙන්ජි මෙම ප්‍රහාරයේ වගකීම බාරගෙන තිබෙනවා. මෙම ප්‍රහාරය ''සාම මෙහෙයුමේ'' (Operation Peace Hunt) ආරම්භය බවයි ඔහු පවසන්නේ, මාඕවාදීන්ට එරෙහිව මෑතකදී ක්‍රියාත්මක කළ රජයේ ''හරිත දඩයම් මෙහෙයුම'' (Operation Green Hunt) ට ලැබුණු මාඕවාදීන්ගේ ප්‍රතිචාරයකි. ''අපි සොයමින් ඉන්නේ සාමය, නමුත් අපිට රජයේ හමුදාවල දුප්පත් භටයින් සමග සටන් කෙරීමට බලකෙරී තිබෙනවා'' මේ මියගිය සොල්දාදුවන් වෙනුවෙන් අපි ශෝක වෙනවා. නමුත් ඔවුන්ගේ මරණවලට වගකිව යුත්තේ ආණ්ඩුවයි.'' යන්න සැඟවී ඉන්න ස්ථානය සඳහන් නොකළ දුරකතන ඇමතුමකින් BBC සේවයට කිසෙන්ජි පවසා තිබෙනවා. ''හරිත දඩයම් මෙහෙයුම'' නැවැත්තුවේ නැතිනම් මීට වඩා දරුණු සටන් ඇති විය හැකි බවට මාඕවාදී නායකයා අනතුරු හඟවනවා.

මේ මස මුල් වකවානුවේ පාර්ලිමේන්තු කටයුතු ඇමති P. චිදම්බරන්, මාඕවාදී බලපෑම් සහිත ප්‍රාන්ත 4 ක් වන බටහිර බෙංගාලය, ජාක්හැන්ඩ්, බිහාර් හා ඔරිස්සා සම්බන්ධයෙන් කල්කටා වල රැස්වීමක් කැඳවා තිබුණි. හිංසනයෙන් නවතා දමන බවට දිව්රා පොරොන්දුවෙමින් කැරලි කරුවන් සාකච්ඡා ආරම්භ නොකෙරුවොත්, හරිත දඩයම් මෙහෙයුම දැඩිව ක්‍රියාත්මහක කරන බවට ඔහු අනතුරු හැඟවූවේය.

ඊට මාඕවාදීහු කියා සිටියේ දැනට සිර අඩස්සියේ සිටින ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ නායකයින් 4 දෙනා නිදහස් කර, හරිත දඩයම් මෙහෙයුම නවකතා දමන්නේ නම් සාකච්ඡා ආරම්භ කිරීමට ඔවුන් එකඟ වී සිටින බවයි.

## එක් ඉන්දියාවක්; 2010 පෙබරවාරි 16

සිල්ඩා ගම්මානය - පිරකාටා (West Bengal): 20-22 පමණ මාඕවාදී යතුරුපැදි පදවන කැරලිකරුවෝ ERF පැරා මිලිටරි කඳවුරටද, බටහිර බෙංගාලයේ මිඩ්නාපූර් කඳවුරටද, සඳුදා සිල්ඩා ගම්මානයේ සන්නද්ධ පොලිස් කඳවුරට වැදීම සහ එම කඳවුර ගිනි තබා විනාශ කිරීම (පෙබරවාරි 15).

පසුගිය වසරේ මාඔවාදී විරෝධී ආක්‍රමණශීලී ප්‍රහාරයන් දියත් කරන ලද බටහිර ප්‍රාන්ත අගනුවර වන කොල්කටා හි සිට 200km (සැතපුම් 125) නුදුරින් පිහිටි කඳවුරක් වටා රහස් රැකවල් යොදා සැඟවී පහර දී ඇති බව පොලීසිය කියා සිටියි.
මෙම කඳවුරට එල්ල වූ රහස් රැකවල් (ambush) ප්‍රහාරයේ ලොමුදැහැගැන්වෙන අත්දැකීම සිහිපත් කරමින්, ERF භටකණ්ඩායමේ සිට දිවි ගලවාගත් සොල්දාදුවෙක් එම සිදුවීම අඟහරුවාදා මෙසේ සඳහන් කළේය.

කැරලිකරුවන් ප්‍රහාරය එල්ල කරන විට ERF භටයා වන K. ලම්බා අමාරුවෙන් බේරී අසල වන ලැහැබට බඩගා ඇත. යතුරුපැදිවලින් පැමිණි කාන්තා කාඩර්වරුන් ගෙන් පවා සමන්විත වූ එම කැරලිකරුවන් ඔවුනට ප්‍රහාරය දියත් කරන විට, ඔවුහු කිසි වක් නොදැන සිටි බව ඔහු පවසයි.

කෙසේනමුත් එය සටන්කරුවන් 100 ක පමණ කණ්ඩායමක් බවත් ඔහු කියා සිටී. ''මාඕවාදී කාන්තා සෙබලියන්ද සහිතව අඩුතරමින් එතැන 100 ක් වත් සිටියා. ඔවුහු භූමිතෙල් වත්කර කඳවුරට ගිනි තැබුවා. අපිට වෙඩි තියන විට කිසිවක් නොදැන සිටි අපි අන්දුන් කුන්දුන් වුනා'' යි ලම්බා පැවැසුහ.

''එක පාරටම හෙණ ශබ්දයක් ඇහෙනකොට රාත්‍රී කෑමෙන් පසුව මම තද නින්දේ සිටියෙමි. පසුව උදේට මම එළියට ගොස් බැලුවා, මට දැනුනා විදියට ඒ බිම් බෝම්බයක් පුපුරා ගිහින්'', යැයි පිරාකාටාවල පදිංචිකරුවෙකු වන දනෙස්වෝර් මහාටෝ කියා සිටියේය; ''මීට පෙර මම මෙවැනි සිදුවීමක් කිසි දින දැක තිබුණේ නෑ.''

බටහිර මිඩ්නාපූර් දිස්ත්‍රික්කයේ ලාල්ගාර් ප්‍රදේශයේ ඒකාබද්ධ පැරා මිලිටරි කඳවුර මුළුමනින්ම ගින්නෙන් අළු වී තිබුණි. බුහුපින්ඩර් සිං, බටහිර බෙංගාල් පොලිස් අධ්‍යක්ෂ ජෙනරාල්වරයා (DGP) අඟහරුවාදා සිද්ධිය වූ සිල්ඩාවට පැමිණ කඳවුරු භූමිය පරීක්ෂා කර තිබුණා. මිඩ්නාපූර් නගරයට 75km ක් නුදුරින් පිහිටි මෙම කඳවුරේ අනියම් නිවාස 50 ක පමණ ලැගුම් ගෙන සිටි EFR සේනාංකයට අනුබද්ධ ජවානාස්වරු ලාල්ගාර්හි මාඕවාදීන්ට එරෙහිව ඒකාබද්ධ පැරා මිලිටරි හමුදා මෙහෙයුමට සහභාගිවෙමින් තිබුණා.

එම කඳවුරට එල්ල වූ මාඕවාදී ප්‍රහාරයෙන් මියගිය ජවානාස්වරු 24 දෙනාගේ සිරුරු සඳුදාවන විටත් හඳුනා ගනිමින් සිටිනවා. සමහරුන්ගේ ශරීර ගින්නෙන් හොඳටම පිලිස්සී තිබුණ අතර අනෙක් මරණ වෙඩි වැදී ඇතිවූ තුවාලවල ප්‍රතිඵලයක්. මාඕවාදීහු වෙඩි තබා, කඳවුර ගිනිබත් කොට, අවි ආයුධ හා පතරොම්ද රැගෙන ගොස් තිබනවා.

පසුගිය වසරේ ජුනි මාසයේදී, බටහිර මිඩ්නාපූර් ප්‍රදේශයේ, ගම්මාන 150 කින් සමන්විත පොකුරු ගම්මානයක්වන ලාල්ගාර්, පොලීසිය සිය පාලනය යටතට ගෙන තිබෙන්නේ කැරලිකරුවන් පලවා හරිමිනුයි.

පොලිස් DGP බුහුපින්ඩර් සිං කියා සිටියේ මෑතකදී සිදුකල ප්‍රහාරයෙන් කැරලිකරුවෝ දැවැන්ත අවි ආයුධ තොගයක් රැගෙන පළා ගිය බවයි.

කිසෙන්ජි නමින් හඳුන්වන කැරලි කණ්ඩායම් නායක කොල්කටා ප්‍රවෘත්ති නාලිකාවකට දුරකථනයෙන් අමතා, ප්‍රහාරය පිළිබඳ වගකීම බාරගෙන ඇත. මේ අතරතුර මාඕවාදීහු බැටිමෝර්, පිරාකාටා, නිම්තාලා සහ මිඩ්නාපූර් දිස්ත්‍රික්කයේ සැල්බොනි යන ප්‍රදේශවල පසුදින සඳුදා රාත්‍රියේදී බිම්බෝම්බ අටවා ඇත.

නැගෙනහිර දිළිඳු ගොවි ජනතාව වෙනුවෙන් සටන් වදිමින් , මාඕවාදී අරගලය ආරම්භවූයේ මීට දශක 4 කට පෙරයා. නමුත් අද වන විට පොලීසි සහ රාජ්‍ය දේපල ඉලක්ක කරමින්, ''පහරදී - පලායන'' (hit and run) උපක්‍රම යොදාගනිමින් ඉන්දීය ප්‍රන්ත 28 න් 20 ක් දක්වා ව්‍යාප්තකව තිබෙනවා. පසුගිය වසරේ මැයි මාසයේ පැවති මහා මැතිවරණ දෝංකාරයෙන් පසුව, ග්‍රාමීය ප්‍රදේශයේ පටු තීරයක පාලන බලය රඳවාගෙන සිටින 22000 ක් මාඕවාදී කැරලිකරුවන්ට මුහුණ දීමට ඉන්දීය ආණ්ඩුව තීරණය කර තිබෙනවා.

# Naxal Menace

## නක්සල් තර්ජනය: අවදානම් සහිත කඳවුර යලි අලුත්තැනක ස්ථානගත කිරීම.

Times of India - 2010 පෙබරවාරි 10,

Kolkata: සිල්ඩාහි සිදුවූ ඝාතනයෙන් පසු රජය මාඕවාදීන්ට එරෙහි සටන් සැලසුම යලි කෙටුම්පත් කොට අලුතින් ආරම්භ කරන්න පටන්ගෙන තියෙනවා. මධ්‍යම හමුදාව සූදානම් වූ වහාම ''හරිත දඩයම් මෙහෙයුම'' ඉදිරියට ගෙනයනවා හැර වෙනත් විකල්පයක් නැත. නමුත් ඊට ප්‍රථමයෙන් ඝන වනාන්කරයේ බිම් බෝම්බ ඉවත් කර ගැනීමට, විශ්වාසයක් නොමැති භූමි භාග පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමට සහ හමුදා කඳාවුරු ඉවත් කර ගැනීමේ කටයුතු සිදු කිරීමට තියෙනවා.

පසුගිය බදාදා රජ්යේ උසස් නිළධාරීන් (Top brass) අවදානම් යැයි උපකල්පිත ජැන්ගල් මාල්හි පිහිටි හමුදා කඳවුරු විසුරුවා අලුත් තැනක පිහිටුවීමට තීරණය කර තිබෙනවා. මේවා නම් ගිදාහනි, මර්ම්පූර්, ජම්තොල් ගෝරා (ආන්ද්‍රා කඳුකර වනාන්තර), බැන්ස්පහාරි, සහ බයිසනාබ්පූර් (තරපාභානි ගං ඉවුරේ, සහ ගාග්‍රා වනාන්තරයේ පිහිටි) කඳවුරු සහ බෙල්පහාරි වල පිහිටි තවත් කඳවුරු 11 ක් වෙති.

Greyhound (නීත්‍යානුකූල නොවන බල ඇණි) වැනි විශේෂ හමුදාවක් සකස් කර ගැනීම සඳහා කාලයක් අවශ්‍ය වෙයි. අතිරේක අමධ්‍යම හමුදාව ළඟාවීමටත් තවත් දින කීපයක් ගතවෙයි. එනිසා, පවතින තත්ත්වයට අනුකූලව, දුෂ්කරතාවයන් මගහරවා ගෙන වහා ක්‍රියාත්මත විය හැකි මූලෝපායන්ට ප්‍රමුඛස්ථානයක් දීමට රජයට සිදුව තිබෙනවා.

ස්වදේශ කටයුතු භාර ලේකම් අර්දන්දු සෙන් කියා සිටියේ අවදානම් සහිත කඳවුරු වල ලේඛණයක් දැනටමත් පිලියෙල කර ඇති බවයි. ඉන් සමහරක් විසුරුවා හැර අනක් ඒවා වෙනත් ස්ථානවල පිහිටුවනවා. EFR ජවානස්වරුන් 24 කට මරු කැඳවූ මාරාන්තික සටනක් දියත් කළ කාර්ය බහුල වළඳ පොලක් පිහිටි සිල්ඩා කඳවුරේ පිහිටුම මාඕවාදීන්ට වාසිදායක වී තිබුණා.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිළධාරීන් දෙනෙක්වන සුනිල් සිං සහ D.S. දද්වාල් - බදාදා සිල්ඩා කඳවුරට සහ බෙල්පහාරි වල සංචාරයක යෙදී තිබෙනවා. ඔවුනට මිද්නාපූර්හි පොලිස් ස්ථානාධිපති මනෝජ් වර්මා මුණ ගැසුනා; බ්‍රහස්පතින්දා ඔවුහු මධ්‍යම රජයට වාර්තාවක් බාර දීමට බලා පොරොත්තු වුණා.

ජ්‍යෙෂ්ඨ පොලිස් නිළධාරියෙක් පැවසුවේ පසුගිය ප්‍රහාරයෙන් පසු ජන්ගල්මහල් හි පිහිටි සියළුම කඳවුරු වෙනස්කර ඇති බවත්, ආරක්ෂාව තර කිරීම පිණිස අවශ්‍ය පියවර ගෙන ඇති බවත්ය. විශාල හමුදාවක කණ්ඩායමක් පැමිණෙන තෙක්, මෙම කඳවුරුවල රැකවල් ශක්තිමත් කෙරෙනු ඇත.

NMSG
පරිවර්තනයකි
T 14

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com